**කෘෂිකාර්මික අංශය නවීකරණය සඳහා වූ ව්‍යාපෘතිය-01 කොටස - 2017**

---

කෘෂිකාර්මික අංශය නවීකරණය සඳහා වූ ව්‍යාපෘතියේ-01 කොටසේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය අතර 2017 ජනවාරි 17 දින එළඹි අංක 5873 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ - 2 උපලේඛනයේ, II, බී, 3 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ 01 කොටසේ මූල්‍ය ගිවිසුම අනුව, එවකට ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය, වර්තමානයේ සමාජ සුභසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ සහ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ කෘෂි ඵලදායිතාවය ඉහල නැංවීමට, වෙළඳපොළ ප්‍රවේශයන් වැඩි දියුණු කිරීමට සහ උතුරු, උතුරු මැද, මධ්‍යම සහ ඌව පළාත්වල සුළු පරිමාණ ගොවීන්ගේ හා කෘෂි ව්‍යාපාරවල අගය එකතු කිරීම වැඩි කිරීමට සහය ලබාදීම වේ. තවද, වානිජ සහ අපනයන කෘෂි කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ගොවි සංවිධාන සහ කෘෂි ව්‍යාපාරයන් ඉහල වටිනාකමක් සහිත කෘෂි නිෂ්පාදන හා වටිනාකම් එකතු කිරීම සඳහා ආයෝජනයන් ආකර්ෂණය කර ගැනීම සහ දිරිමත් කිරීමට සහය ලබාදීම සහ (අ) ආයෝජන සූදානම් කිරීම සඳහා සහය ලබාදීම (ආ) නිෂ්පාදන ආයතන සහ කෘෂි ව්‍යාපාර සඳහා ප්‍රාග්ධන ගැලපුම් දීමනා ලබාදීම සහ (ඇ) ණය කොටසක් සඳහා ඇපවීම ඇතුළුව එවැනි ආයෝජන සඳහා වාතාවරණය, දිරිගැන්වීම් සහ මූල්‍ය පහසුකම් ලබාදීමට සහයවීම. මූල්‍ය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 15,413.78 කට සමාන එජඩො මිලියන 105.61 ක් වූ අතර ඉන් රු.මිලියන 8,956.95 කට සමාන එජඩො මිලියන 61.37 ක් සැපයීමට ජාත්‍යන්තර සංවර්ධන සමායතනය එකඟවී තිබුණි. ඊට අමතරව රු.මිලියන 6,436.40 කට සමාන එජඩො මිලියන 44.10 ක් ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් විසින් දායකවීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ඔක්තෝබර් 15 දින ආරම්භ කරන ලද අතර 2021 ඔක්තෝබර් 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩි දියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් ව්‍යාපෘතිය විසින් දරන ලද වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක තැන්පතුව, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේ ද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනා ගෙන තිබුණේද යන බව,

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණේ ද යන බව, සහ

(එ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන
----------------

### 2.1 මතය
-------

මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක තැන්පතුව, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) මූල්‍ය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඉ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

#### 2.2.1 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම්
--------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2016 මාර්තු 24 දිනැති අංක 01/2016 චක්‍රලේඛයේ 09 වගන්තියේ අවශ්‍යතාවය අනුව, ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල සුමට ක්‍රියාකාරිත්ව සඳහා ව්‍යාපෘති පාලන කමිටු ස්ථාපිත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘතිය විසින් රු.මිලියන 4.25 ක පිරිවැයකට වෙබ් අඩවි පදනම් කර ගත් ජීඅයිඑස් (GIS) මෘදුකාංගයක් මිලදී ගෙන තිබුණු අතර මුදල් අමාත්‍යාංශයේ 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/ 2002/02 චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක සහ උපාංග ලේඛනයේ වාර්තා කර නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය ගිවිසුමේ මූල්‍යයනය කිරීමට එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම් | | 2017 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො මිලියන | රු. මිලියන | එ.ජ.ඩො මිලියන | රු. මිලියන | එ.ජ.ඩො මිලියන | රු. මිලියන |
| ජා.සං.ස | 61.37 | 9,213.01 | 4.66 | 700 | 2.19 | 335.00 |
| ප්‍රතිලාභීන්ගේ දායකත්වය | 44.10 | 6,620.39 | - | - | - | - |
| ශ්‍රීලංර | 0.14 | 21.00 | 0.33 | 50 | - | - |
| එකතුව | **105.61** | **15,854.40** | **4.99** | **750** | **2.19** | **335.00** |

වාර්ෂික අයවැය ඇස්තමේන්තුවට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් වෙනුවෙන් එකතුව රු.මිලියන 750 ක් වෙන් කර තිබුණි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළදී මුළු වෙන්කිරීමෙන් සියයට 44.67 ක් නියෝජනය වන එකතුව රු.මිලියන 335 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

### 3.2 භෞතික ප්‍රගතිය

ආයෝජන සූදානම් කිරීම සඳහා සහය ලබාදීම, කෘෂි නිෂ්පාදන සංවිධානවලට ප්‍රාග්ධන ගැලපුම් දීමනා ලබාදීම සහ ප්‍රාග්ධන ගැලපුම් දීමනා ලබාදීමේ වැඩසටහන යටතේ ප්‍රතිලාභීන්ට ණයදීමට උනන්දුවක් දක්වන සහභාගීත්ව මූල්‍ය ආයතන සමඟ මූල්‍ය අවධානම බෙදාගැනීමට ණය කොටසක් සඳහා ඇපවීම වැනි අනු සංරචක 03 කින් ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සමන්විත වේ. ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෙන්කරන ලද සම්පත් භාවිතයෙන් සැලසුම් කරන ලද කාල පරිච්ඡේදය තුළදී ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා පරිපූර්ණ විස්තරාත්මක සංයුක්ත සැලැස්මක් සකස් කළ යුතු වුවද, එය පිළියෙල කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘතිය ආරම්භක දිනයේ සිට වර්ෂයක් ඉකුත්වී ඇතත් ව්‍යාපෘතියේ ණය සඳහා ඇපවීම් සංරචකය යටතේ ක්‍රියාකාරකම් සිදුකිරීමට වෙන් කරන ලද එ.ජ.ඩො මිලියන 7.12 ක් 2017 දෙසැම්බර් 31 දින දක්වා උපයෝජනය කර නොතිබුණි.

(ඇ) ව්‍යාපෘතිය ප්‍රාග්ධන ගැලපුම් දීමනා ප්‍රදානයට කෘෂි ව්‍යාපාර හා සම්බන්ධ පෞද්ගලික ආයතන 04 ක් තෝරා ගෙන තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දින එම ආයතන වෙනුවෙන් වටිනාකම

රු.මිලියන 46.91 ක චෙක්පත් ලියා තිබුණු අතර ව්‍යාපෘතියේ වියදමක් ලෙස වාර්තා කර තිබුණි. කෙසේවෙතත්, 2018 මැයි 31 දින වන විටත් එම චෙක්පත් ආයතනවලට භාරදී නොතිබුණි.

(ඇ) අධික දරිද්‍රතාවයක් සහිත පිරිසක් සිටින ප්‍රදේශ වශයෙන් හඳුනා ගැනුණු යාපනය, මුලතිව්, අනුරාධපුරය, මඩකලපුව, මොණරාගල, මාතලේ සහ පොළොන්නරුව යන ප්‍රමුඛ දිස්ත්‍රික්ක 07 ක ආසන්න වශයෙන් කෘෂි නිෂ්පාදන සංවිධාන 350 කට සහයෝගය ලබාදීමට ප්‍රාග්ධන ගැලපුම් දීමනා වැඩසටහන බලාපොරොත්තු වේ. කෙසේවෙතත්, ව්‍යාපෘතිය ප්‍රාග්ධන ගැලපුම් දීමනා වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ගාල්ල සහ කොළඹ දිස්ත්‍රික්ක තෝරා ගෙන තිබුණි.

## 3.3 මතභේදයට තුඩුදෙන ගැටළු

------------------------------

අදාල අධිකාරින්ගෙන් අනුමැතිය ලබාගැනීමෙන් තොරව ඊශ්‍රාලයේ නිල සංචාරය සඳහා අමාත්‍ය ප්‍රමුඛව පුද්ගලයන් 20 දෙනෙකුගේ ගුවන් ගමන්, යැපුම් දීමනා සහ අනෙකුත් වියදම් දැරීම සඳහා ව්‍යාපෘතිය විසින් එකතුව රු.මිලියන 11.85 ක් වියදම් කර තිබුණි.

## 3.4 පරිබාහිර වියදම්

-----------------

සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘතිය රු.මිලියන 15.7 ක පිරිවැයකට මෝටර් වාහන 02 ක් මිලදී ගෙන තිබුණද, ව්‍යාපෘතියේ කටයුතු සඳහා භාවිතා කිරීමෙන් තොරව එම වාහනය සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයට මාරු කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතිය රේඛීය අමාත්‍යාංශයෙන් භාවිතා කරන ලද මෝටර් වාහනයක් භාර ගෙන ඇති අතර එම වාහනය අලුත්වැඩියා කිරීම සඳහා එකතුව රු.මිලියන 0.51 ක් වියදම් කර තිබුණි.

## 3.5 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2016 මාර්තු 24 දිනැති අංක 01/2016 චක්‍රලේඛයේ 3.2 වගන්තියට අනුව, ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලයේ වැටුප් ව්‍යාපෘතියේ විදේශ දායකත්වය මත පදනම්ව තීරණය කළ යුතුය. කෙසේවෙතත්, මෙම ව්‍යාපෘතියේ විදේශ දායකත්වය එ.ජ.ඩො. මිලියන 61.37 ක් ව පැවතියද, එජඩො මිලියන 100 වැඩි ව්‍යාපෘති කාණ්ඩය යටතේ ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලයේ වැටුප් තීරණය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලයේ වැටුප් වැරදි ලෙස තීරණය කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු.මිලියන 3.28 ක් වැඩිපුර ගෙවා තිබුණි.